පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 12 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂය :- දේශපාලන විද්‍යාව 23,S i

පාසලේ නම :..........................................................................................................

ඇතුළත්වීමේ අංකය :.......................................

කාලය : පැය දෙකයි

උපදෙස් :-

- ❖ මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් දෙකකින් සමන්විත ය.
- ❖ **A** කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් සහ **B** කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20 කින් යුක්ත වේ.
- ❖ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
- ❖ එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 100 කි.

## A කොටස

❖ අංක 01 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිලිතුර තෝරන්න.

1. දේශපාලනය යනු,
    1) රාජ්‍ය හා ආණ්ඩුව සම්බන්ධ විෂයක් වේ.
    2) බල තරගය හා බැඳුණු සමාජ විද්‍යා විෂයක් වේ.
    3) ආණ්ඩුකරණයට සම්බන්ධ රාජ්‍ය කේන්ද්‍රීය විෂයක් වේ.
    4) දේශපාලනඥයින්ගේ වෘත්තීය කේන්ද්‍රීය විෂයක් වේ.
    5) වෘත්තීය දේශපාලනඥයින්ගේ සහ සාමාන්‍ය පුරවැසියන්ගේ ද දේශපාලන භාවිතයක් වේ(....)

2. දේශපාලන විද්‍යාව,
    1) විද්‍යාත්මක අධ්‍යයනයට සීමාවන ශික්ෂණයක් වේ.
    2) ජීවිතය නැමැති තක්සලාවේ උගත් ප්‍රායෝගික ශික්ෂණයක් වේ.
    3) ඓතිහාසික විකාශනය තුළ වෙනස්කම්වලට භාජනය නොවූ ශික්ෂණයක් වේ.
    4) දාර්ශනික ලෙස අධ්‍යයනය කිරීමේ ශික්ෂණයට සීමා වේ.
    5) දේශපාලන සංසිද්ධියක් ශාස්ත්‍රීයව අධ්‍යයනය කරන සාමාජීය විද්‍යා ශික්ෂණයක් වේ. (......)

3. දාර්ශනික අධ්‍යයන ක්‍රමයට අදාල වන්නේ,
    1) වාස්තවික දැනුම ගොඩනගනු ලබයි.
    2) ලෝකය පිළිබඳ හා දේශපාලනය පිළිබඳ අති මූලික ප්‍රශ්න අසනු ලබයි.
    3) දැනට පවතින ලෝකය පිළිබඳ කරනු ලබන විග්‍රහයකට සීමා වේ.
    4) අනාගත අපේක්ෂාවන්ගෙන් සහ වටිනාකම් නිශ්චයන්ගෙන් වියුක්තය.
    5) අනුභවික ක්‍රමවේදය මත පදනම් වේ. (......)

4. අර්ථ ශාස්ත්‍රීය අධ්‍යයන ක්‍රමය,
    1) දේශපාලනය අනෙකුත් සමාජ විද්‍යා අතර පවතින සම්බන්ධතාවය අධ්‍යයනය කරයි.
    2) දේශපාලන ප්‍රස්තුත සංසන්දනාත්මකව අධ්‍යයනය කරයි.
    3) දේශපාලනය හා ආර්ථිකය අතර පවත්නා සම්බන්ධතාවය පැහැදිලි කරයි.
    4) දේශපාලනය හා සමාජ විද්‍යාව හා මානව විද්‍යාව අතර සම්බන්ධතාවය අධ්‍යයනය කරයි.
    5) දේශපාලනය පිළිබඳ ප්‍රතිමානිය ඇගයුම් සහ විමර්ශන ඉදිරිපත් කරයි. (.......)

5. දේශපාලන මතවාදයක ස්වභාවය වන්නේ,

1) සමාජ කණ්ඩායම් බල දේශපාලන විඥාණය , විශ්වාසය සහ ඉදිරි දැක්ම හැඩගැසීමට බලපානු ලැබේ.
2) එකිනෙකට පරස්පර අදහස්වලින් යුක්ත වේ.
3) සමාජ කොටස්වල ආධ්‍යාත්මික වර්ධනය ප්‍රධානම ඉලක්කය වේ.
4) ක්‍රියාකාරී දේශපාලනයට මග පෙන්වන්නෙක් නොවේ.
5) භාවිතයෙන් තොර න්‍යාය සහ සංකල්ප වල එකතුවක් වේ. (.......)

6. ආණ්ඩුව,

1) පරමාධිපත්‍යය බලය හිමි රාජ්‍යයේ සේවකයා වේ.
2) රාජ්‍යයේ ප්‍රධාන ආයතනික නියෝජිතයා වේ.
3) සමාජ දේශපාලන බල යේ කේන්ද්‍රීය ආයතනය වේ.
4) සම්භාව්‍ය දේශපාලන චින්තනයේ රාජ්‍යයෙන් වෙන්ව භාවිත වූවකි.
5) පූර්ව ප්‍රජතන්ත්‍රවාදී යුගයේදී ජනතාව තෝරා පත්කළ සීමිත ආයතනයකි. (.......)

7. දේශපාලන පක්ෂ.

1) පක්ෂයක් සිය මතය නියෝජනය කරයි.
2) පක්ෂ ගොඩනැගී ඇත්තේ ඉතා දිගු ඉතිහාසයක් තුළින් ය.
3) පක්ෂ යනු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකාරීන් නොවේ.
4) දේශපාලන පක්ෂ නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ යාන්ත්‍රණයක් වේ.
5) දේශපාලන පක්ෂ සැම විටම ව්‍යවස්ථාවාදීව කටයුතු කරයි. (.......)

8. ස්ත්‍රීවාදය විසින් සමාජ හා දේශපාලන න්‍යායට හඳුන්වා දෙන ලද නව සංකල්පයක් වන්නේ,

1) සීමිත ආණ්ඩුව
2) මානව අයිතිවාසිකම්
3) පංති අරගලය
4) මහජන පරමාධිපත්‍යය
5) ස්ත්‍රී පුරුෂ සමාජභාවය (.......)

9. සමාජවාදය,

1) ධනවාදයට විකල්ප ආර්ථික හා සමාජ දැක්මක් ඉදිරිපත් කර ඇත.
2) ලිබරල්වාදය තුළම වර්ධනය වූ දේශපාලන න්‍යායකි.
3) ධනපති පංතියේ පාලනය සාධාරණය කරයි.
4) පෞද්ගලික දේපළ අයිතිවාසිකම් සාධාරණය කරන මතවාදයකි.
5) 20 වැනි සියවසේ දී යුරෝපයේ බිහි වූ දේශපාලන චින්තන ධාරාවකි. (.......)

10. සන්ධීය ආණ්ඩු ක්‍රමයේ සාධනීය ලක්ෂණයක් වන්නේ,

1) මධ්‍යම ආණ්ඩුව දුර්වල කිරීමයි.
2) පරිපාලනය විමධ්‍යගත කිරීමට සමාන ක්‍රමයක් වීමයි.
3) වෙනස්කම් තිබිය දී දේශපාලන එකමුතුභාවය ප්‍රවර්ධනය කිරීමයි.
4) රටක ප්‍රාදේශිය වෙනස්කම් තියුණු කිරීමයි.
5) ඒකීය නීති පද්ධතියකට පදනම් දැමීමයි. (.......)

11. ඒකීය ආණ්ඩුක්‍රම ,

1) අනෙකුත් ආණ්ඩුක්‍රමවලට සාපේක්ෂව සංකීර්ණ ආණ්ඩුක්‍රමයක් වේ.
2) ස්වාධිපත්‍යය බලය පදනම් ව හඳුනාගන්නා ආණ්ඩුක්‍රම ආකෘතික විශේෂයකි.
3) බලය විතැන් කළ ආණ්ඩුක්‍රම ආකෘතියක් වේ.
4) මධ්‍යම ආණ්ඩුවේ කැමැත්ත අනුව ව්‍යවස්ථාව සංශෝධනය කළ නොහැක.
5) ස්වාධිපත්‍යය බලය පරිධියේ පාලන ආයතනවලට විමධ්‍යගත කළ ආණ්ඩුක්‍රම විශේෂයකි.(....)
6)

12 රාජ්‍යයේ භූමිකාවට ඇතුළත් වන්නේ,

1) පුරවැසි නිදහස සීමා කරන නීති සම්පාදනයයි.
2) සමාජයේ නීතිය හා සාමය පවත්වා ගැනීමයි.
3) සමාජ ගැටුම් සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමයි.
4) රාජ්‍ය ප්‍රතිපත්ති විවේචනයට පාත්‍ර කිරීමයි.
5) ජාතික ආර්ථිකය මෙහෙයවීමේ කාර්යය සම්පූර්ණයෙන්ම වෙළඳපොලට පැවරීමයි. (.......)

13. ගැටුම් සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,

1) ගැටුම් කෙලවර කළ යුත්තේ යුද්ධයක් මගිනි.
2) ගැටුම් ඇතිවීමට දේශපාලන බලය බලපාන්නේ නැත.
3) ගැටුම්වල ඇත්තේ නිශේධනීය පැතිකඩක් පමණි.
4) එකිනෙකට නොපෑහෙන අරමුණු මත ගැටුම් හට ගනියි.
5) ගැටුම් වර්ගීකරණයට භාජනය නොවේ. (.....

14. ස්ත්‍රීවාදී දේශපාලන ධාරාව පැනනැගීමට හේතු වූයේ,

1) ස්ත්‍රීන්ට සමාන රැකියා සමාන වැටුප් යන නෛතික පිළිගැනීම.
2) ස්ත්‍රීන් පොදු දේශපාලන පරිමණ්ඩලයට ඇතුළත් වීම.
3) ස්ත්‍රීන් පළමු පෙළ මනුෂ්‍යයන් ලෙස පිළිගන්නා සමාජ ප්‍රභේද හා භාවිතයන් නිර්මාණය වීම.
4) ඓතිහාසික සමාජය තුළ ස්ත්‍රීන් පොදු සමාජ දේශපාලන ක්ෂේත්‍රයට සමබන්ධ වීම.
5) ස්ත්‍රීන් සමාජ දේශපාලන පීඩනයට හා සූරා කෑමට ලක්වීම. (.......)

15. නිරාගමිකවාදය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,

1) රාජ්‍ය කිසිම ආගමකට පක්ෂපාතීව කටයුතු නොකළ යුතු බව අවධාරණය කරයි.
2) දේශපාලන ප්‍රතිපත්ති සැකසීමේ දී ආගමික මතවාදයන්ට ප්‍රමුඛස්ථානය දිය යුතුය.
3) දේශපාලනය හා ආගම එකට බද්ධ වේ.
4) රාජ්‍ය ක්ෂේත්‍රයට ආගමික බලපෑම් එල්ල කළ හැකිය.
5) රාජ්‍යයේ පැවත්ම තීරණය කළ යුත්තේ ආගමික සංවිධානය විසිනි. (.......)

16. සමූහාණ්ඩුවාදී දේශපාලන න්‍යායට අනුව,

1) පාලකයින්ට දේශපාලන බලය සඳහා උපතින්ම හිමි අයිතියක් තිබේ.
2) දේශපාලන ප්‍රජාවේ පරමාධිපත්‍යය බලයේ හිමිකරුවන් වන්නේ මහජනතාවයි.
3) පුරවැසියන් පොදු යහපත නොව පුද්ගලික අයිතිවාසිකම් සඳහා උනන්දු විය යුතුය.
4) රජුගේ බලය අභියෝගයට ලක්කළ නොහැකිය.
5) පුරවැසියන් දේශපාලනික වශයෙන් සක්‍රීය වීම අවශ්‍ය නැත. (.......)

17. පැසිස්ට්වාදී රාජ්‍යය,
1) ජනතාව දේශපාලනික වශයෙන් ඉහළ සහභාගිත්වයක් දරයි.
2) රාජ්‍යයේ බලය සීමිත වේ.
3) ජනමාධ්‍ය නිදහස උපරිම ලෙස ආරක්ෂා කරනු ලබයි.
4) පුද්ගලයා නොව රාජ්‍ය උත්තරීතර බව පිළිගනු ලබයි.
5) රාජ්‍යයේ උපත, ස්වභාවය හා අනාගතය සම්බන්ධව ක්‍රමානුකූල විග්‍රහයන් සිදු කරයි. (.......)

18. ස්වාධිපත්‍යය,
1) රාජ්‍ය තුළ පුරවැසි අවනතභාවය ලබා ගැනීම බාහිර ස්වාධිපත්‍යය ලෙස හඳුන්වයි.
2) ස්වාධිපත්‍යය බලය අන්සතු කළ නොහැකිය.
3) රාජ්‍යය සතු උත්තරීතර බලය ස්වාධිපත්‍යය ලෙස අදහස් කෙරේ.
4) ස්වාධිපත්‍යය අභියෝගයට ලක් නොවීමට එක් හේතුවක් වන්නේ ගෝලීයකරණයයි.
5) වෙනත් ඕනෑම ස්වාධිපත්‍යය බලයකට යටත් නොවීම අභ්‍යන්තර ස්වාධිපත්‍යය වේ. (.......)

19. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය,
1) අගමැති හා කැබිනට් මණ්ඩලය නාමික විධායකය වේ.
2) පැහැදිලිව බලතල බෙදීමක් දක්වා තිබේ.
3) ආණ්ඩුව පාර්ලිමේන්තුවට සාමූහිකව වග නොකියයි.
4) පාර්ලිමේන්තුව හා දේශපාලන විධායකය එකවර විසුරුවා හරියි.
5) කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයට භාහිර පුද්ගලයින්ගෙන් තෝරා ගනියි. (.......)

20. ජනාධිපති ආණ්ඩුක්‍රමය,
1) ව්‍යවස්ථාදායකය හා විධායකය අතර ශක්තිමත් බැඳීමක් පවතී.
2) ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකය මගින් තෝරා පත් කර ගනියි.
3) ව්‍යවස්ථාදායකයට ජනාධිපතිවරයාව ඉවත් කළ නොහැකි වේ.
4) කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තු සාමාජිකයින් අතරින් පත් වේ.
5) ජනාධිපතිවරයා ආණ්ඩුවේ නායකයා වේ. (.......)

❖ අංක 21 සිට 25 තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

21. යටත් විජිත රාජ්‍ය සම්බන්ධයෙන් අදාල වන්නේ,
A. මව් රාජ්‍යයේ ආධිපත්‍යයට යටත් විය.
B. 1815 දී ශ්‍රී ලංකාව මුළුමනින්ම යටත් විජිතයක් බවට පත්විය.
C. යුරෝපීය නොවන රාජ්‍යයන් තුළ වර්ධනය විය.
D. නීතියේ ආධිපත්‍යය පූර්ණව ක්‍රියාත්මක කරන ලදී.
E. මිලිටරි නිළධාරීවාදී රාජ්‍ය වශයෙන් ගොඩනැගුණි.

1) ABCD 2) BCDE 3) ABDE 4) ACDE 5) ABCE (......)

22. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය ,
A. ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික පරිවර්තනයට පදනම දැමීය.
B. සර්ව ජන ඡන්ද බලය ලබා දුන්නේය.
C. විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දුන්නේය.
D. වාර්ගික නියෝජන ක්‍රමය හඳුන්වා දුන්නේය.
E. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය ශක්තිමත් කළේය.

1) ABCD 2) ABCE 3) ABDE 4) ACDE 5) BCDE (.......)

23. ශ්‍රී ලංකාවේ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂ ලක්ෂණ වූයේ මොනවාද?
A. ශ්‍රී ලංකාවේ ඩොමිනියන් තත්වයට අනුකූල ආණ්ඩු ක්‍රමයක් නිර්මාණය කිරීම.
B. ද්විමණ්ඩලික ව්‍යවස්ථාදායකයක් හඳුන්වා දීම.
C. රාජ්‍ය සේවය කැබිනට් මණ්ඩලයේ පාලනය යටතට පත් කිරීම.
D. වෙස්මිනිස්ටර් ආකෘතියට සමාන වූ ආණ්ඩු ක්‍රමයක් නිර්මාණය කිරීම.
E. අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම.

1) ABCD 2) ABCE 3) ABDE 4) ACDE 5) BCDE (……)

24. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,
A. අධිකරණ සේවා කොමිෂන් සභාවක් ස්ථාපිත කරන ලදී.
B. ශ්‍රී ලංකාවට පූර්ණ නිදහස ප්‍රදානය කරන ලදී.
C. නාමික විධායක ධූරයක් හඳුන්වා දුන්නේය.
D. ද්වි මණ්ඩලික ව්‍යවස්ථාදායකයක් පිහිටුවන ලදී.
E. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය හඳුන්වා දුන්නේය.
1) ABCD 2) ABCE 3) ABDE 4)ACDE 5)BCDE (……)

25. ශ්‍රී ලංකාවේ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂ ලක්ෂණ වූයේ මොනවාද?
A. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මූලික අයිතිවාසිකම් ඇතුළත් කිරීම.
B. උත්තර මන්ත්‍රී මණ්ඩලයක් නිර්මාණය කිරීම.
C. රාජ්‍ය නායකයා අගමැතිවරයා විසින් පත් කිරීම.
D. රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්ම ඇතුළත්කිරීම.
E. ජනතාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිර්මාතෘවරුන් ලෙස පිළිගැනීම.
1) ABCD 2) ABCE 3) ABDE 4) ACDE 5) BCDE (……)

❖ අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත.එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධ දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැලපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1) (2) (3) (4) සහ (5) යන වරණවලින් කවර වරණය දැයි තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | 1 ප්‍රකාශය | 2 ප්‍රකාශය |
|---|---|---|
| 01 | සත්‍යය | සත්‍යය |
| 02 | සත්‍යය | අසත්‍යය |
| 03 | අසත්‍යය | සත්‍යය |
| 04 | අසත්‍යය | අසත්‍යය |
| 05 | සත්‍යය | සත්‍යය වන අතර පලමු ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | | | |
|---|---|---|---|
| 26. | දේශපාලනයට ආගම සම්බන්ධ කරගැනීම නිරාගමිකවාදය නම් වේ. | සෑම ආගමකටම එක සමාන සැලකීම ඉන්දියානු ජාතිකවාදයේ ප්‍රතිපත්තිය වේ. | (……..) |
| 27. | පුද්ගලයින් අතර නොපෑහෙන අරමුණු හේතුකොටගෙන ගැටුම් ඇති වේ. | ගැටුම් මගින් ශේධනීය මෙන්ම නිශේධනීය ප්‍රතිඵල ඇතිවේ. | (……..) |
| 28. | පූර්ව රාජ්‍යය යුගවල රාජ්‍ය හා ආණ්ඩුව අතර වෙනසක් පැවතුනි. | නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යවල රාජ්‍ය රාජ්‍ය ආණ්ඩුව අතර වෙනසක් දක්නට නොලැබේ. | (……..) |
| 29. | 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ විශේෂ ලක්ෂණයක් වූයේ සර්ව ජන ඡන්ද බලය ලබා දීමයි. | සර්වජන ඡන්ද බලය ලබා දීම මගින් ජනතාවගේ දේශපාලන අවබෝධය වර්ධනය විය. | (……..) |

| | | | |
|---|---|---|---|
| 30. | 1972 ව්‍යවස්ථාව යටතේ ලංකාවට පලමු වතාවට මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ඇතුළත් කරන ලදී. | එම මූලික අයිතිවාසිකම් කඩ වූ අවස්ථාවක ගත යුතු ක්‍රියාමාර්ග ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිමත්ව සඳහන් වී තිබුණි. | (........) |

## B කොටස

31. දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර සම්බන්ධය දැකිය හැකි පැති **දෙක** නම් කරන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

32. යුරෝපය සහ ඇමරිකාව තුළ දේශපාලන පක්ෂවල කාර්යභාරය තහවුරු වීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක **දෙක** දක්වන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

33. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක දේශපාලන විධායකය සහ නාමික විධායකය යන තිලතල දරන්නේ කවුද?

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

34. i) පොදු කැමැත්ත යන සංකල්පය ඉදිරිපත් කළ දේශපාලන චින්තකයා නම් කරන්න.

..........................................................................................................................

ii) පශ්චාත් යටත් විජිත රාජ්‍ය යන සංකල්පය ඉදිරිපත් කළ න්‍යායවේදියා නම් කරන්න.

..........................................................................................................................

35. i) රාජ්‍ය ආගම සමඟ අනන්‍ය නොවිය යුතු බව ප්‍රකාශ කරන දේශපාලන මතවාදය කුමක්ද?

..........................................................................................................................

ii) ධනවාදය අහෝසි කිරීම අවධාරණය කරන දේශපාලන මතවාදය කුමක්ද?

..........................................................................................................................

36. ගැටුම්වල දේශපාලන වර්ගීකරණයට අනුව මහාචාර්ය පීටර් වොලන්ස්ටීන් (Peter Wallensteen) ගැටුම් වල ස්වභාවය තුන් ආකාරයකට වර්ග කොට ඇත.ඉන් **දෙකක්** නම් කරන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

37. රාජ්‍යයේ ස්වාධිපති බලය බෙදී යන්නා වූ ආකාරය මත ආණ්ඩු වර්ග කරන ආකාර **දෙකක්** ලියන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

38. දේශපාලන ව්‍යාපාරයක් ලෙස ජාතිකවාදයේ ප්‍රධාන ස්වරූප **දෙකක්** තිබේ. ඒවා මොනවාද?

(i) ..........................................................................................................................
(ii) ..........................................................................................................................

39. ගෝලීයකරණය මගින් ජාතික රාජ්‍යයට වන බලපෑම න්‍යායික ප්‍රවේශ **දෙකක්** ඔස්සේ විග්‍රහ කරයි.ඒවා නම් කරන්න.

(i) ..........................................................................................................................
(ii) ..........................................................................................................................

40. යටත් විජිත ආර්ථික ක්‍රමයත් සමඟ ලංකාව තුළ ද්විත්ව ආර්ථික ක්‍රමයක් ඇතිවිය. එම ක්‍රම **දෙක** දක්වන්න.

(i) ..........................................................................................................................
(ii) ..........................................................................................................................

41. 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණය මගින් ආණ්ඩුකාරවරයාගේ බලතල සීමා කරමින් ඇතිකළ දේශපාලන ආයතන **දෙක** නම් කරන්න.

(i) ..........................................................................................................................
(ii) ..........................................................................................................................

42. 1910 කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය තුළින් හඳුන්වා දුන් ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයින් බෙදෙන ප්‍රධාන ආකාර **දෙක** ලියා එහි සාමාජික සංඛ්‍යාව ලියන්න.

(i) ..........................................................................................................................
(ii) ..........................................................................................................................

43. ස්ත්‍රීවාදය මගින් දේශපාලන සහ සමාජ භාවිතයට එක්කරන ලද න්‍යායික සංකල්ප ගණනාවකි. ඉන් **දෙකක්** නම් කරන්න.

(i) ..........................................................................................................................
(ii) ..........................................................................................................................

44. i) රාජ්‍ය සතු අධිකාරී බලය විස්තර කෙරෙන දේශපාලන විද්‍යා සංකල්පය කුමක්ද?

..........................................................................................................................

ii) රාජ්‍යය යනු සමාජයේ ඇති සර්ව බලධාරී සහ පරමෝත්තම සංවිධානය වන්නේය, යන නිර්වචය රාජ්‍යයට සපයන ලද්දේ කවර දේශපාලන මතවාදයක් විසින්ද?

..........................................................................................................................

45. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ව්‍යවස්ථාදායකය හැඳින්වූ නාමය සහ එහි සංඛ්‍යාව දක්වන්න.

(i) ..........................................................................................................................
(ii) ..........................................................................................................................

46. 1947 සෝල්බරි පාර්ලිමේන්තුව සකස් වූයේ ප්‍රධාන ආයතන තුනක එකතුවෙනි. ඉන් **දෙකක්** සඳහන් කරන්න.

(i) ..........................................................................................................................
(ii) ..........................................................................................................................

47. 1947 සෝල්බරි ව්‍යවස්ථාවයටතේ සහ 1972 පළමු ජනරජ ව්‍යවස්ථා යටතේ නාමික විධායකය සඳහා භාවිත කළ නිල නාම **දෙක** ලියන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

48. 1947 සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ විධිවිධාන **දෙකක්** සඳහන් කරන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

49. නූතන ආණ්ඩුක්‍රමය තුළ ව්‍යවස්ථාදායකය සංවිධානය කිරීම සඳහා යොදාගැනෙන ආකෘති **දෙකක්** ඇත. එම ආකෘති දෙක නම් කරන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

50. 1947 සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අධිකරණ හා රාජ්‍ය සේවය ස්වාධීන කිරීම සඳහා ඇතිකළ ආයතන **දෙක** නම් කරන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 12 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂය :- දේශපාලන විද්‍යාව 23,S, ii

පාසලේ නම :..................................................................................

ඇතුළත්වීමේ අංකය :.......................................  කාලය : පැය තුනයි

උපදෙස් :
- ❖ අමතර කියවීමේ කාලය **මිනිත්තු** 10 යි.
- ❖ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විතය.
- ❖ I කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, II කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, III කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. දේශපාලන විද්‍යාවේ විෂය සමන්විත වන ක්ෂේත්‍ර විස්තර කරන්න. (ලකුණු 20)

2. පහත දැක්වෙන මාතෘකා අතරින් මාතෘකා **දෙකක්** පිළිබඳ සාකච්ඡා කරන්න.
   (i) දේශපාලන පක්ෂ
   (ii) ස්ත්‍රීවාදී ප්‍රවේශය
   (iii) බලපෑම් කණ්ඩායම්
   (iv) විද්‍යාත්මක ප්‍රවේශය (ලකුණු 10×2)

3. ඒකීය හා සන්ධීය ආණ්ඩුක්‍රම අතර වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 20)

## II කොටස

4. කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය තුළින් ලංකාවේ දේශපාලන හා ආර්ථික පරිවර්තනය පැහැදිලි කරන්න. (ලකුණු 20)

5. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ඇසුරින් පහත සඳහන් මාතෘකා **දෙකක්** පැහැදිලි කරන්න.
   (i) සර්වජන ඡන්ද බලය
   (ii) විධායක කාරක සභා ක්‍රමය
   (iii) රාජ්‍ය මන්ත්‍රණ සභාව (ලකුණු 10×2)

6. 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමය ඇසුරින් පහත සඳහන් මාතෘකා **දෙකක්** පැහැදිලි කරන්න.
   (i) සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය ඇති කිරීමට හේතු
   (ii) අග්‍රාණ්ඩුකාරවරයා
   (iii) සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂක විධිවිධාන (ලකුණු 10×2)

7. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමයේ නාමික විධායකය හා 1972 ආණ්ඩු ක්‍රමයේ නාමික විධායකය පැහැදිලි කරන්න. (ලකුණු 20)

## III කොටස

8. ගැටුම් වර්ගීකරණ ප්‍රභේද හෝ ගැටුම් සමථන ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ලකුණු 20)

9. පාර්ලිමේන්තු හෙවත් කැබිනට් ආණ්ඩු ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී භාවයෙන් වැඩි වුව ද කාර්යක්ෂමතාවයෙන් අඩුය. පැහැදිලි කරන්න.

(ලකුණු 10×2)

10. පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.
    (i) පැසිස්ට් වාදයේ ලක්ෂණ
    (ii) නිරාගමිකවාදය
    (iii) දාර්ශණික ප්‍රවේශය
    (iv) 1931 අමාත්‍ය මණ්ඩලය
    (v) සමාජවාදය (ලකුණු 10×2)

# 2023 දේශපාලන විද්‍යාව
# 12 වසර
# ලකුණු දීමේ පටිපාටිය
# I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|
| 01. | 5 | 11. | 2 | 21. | 5 |
| 02. | 5 | 12. | 4 | 22. | 2 |
| 03. | 2 | 13. | 2 | 23. | 3 |
| 04. | 3 | 14. | 5 | 24. | 4 |
| 05. | 1 | 15. | 1 | 25. | 4 |
| 06. | 2 | 16. | 2 | 26. | 3 |
| 07. | 4 | 17. | 4 | 27. | 1 |
| 08. | 5 | 18. | 3 | 28. | 4 |
| 09. | 1 | 19. | 4 | 29. | 5 |
| 10. | 3 | 20. | 5 | 30. | 2 |

එක් පිළිතුරකට ලකුණු 02 බැගින්,

අවසාන ලකුණු - 2 × 30 = 60

**B කොටස - කෙටි පිළිතුරු**

31. i)දේශපාලනය කිරීම.
    ii)දේශපාලනය හැදෑරීම.

32. i)නියෝජන ආණ්ඩුක්‍රමය ව්‍යාප්ත වීම.
    ii)ඡන්ද බලය ව්‍යාප්ත වීම.

33. i)අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය
    ii)ජනාධිපති, රැජින, ආණ්ඩුකාරවරයා

34. i)ජීන්ජැක් විස් රූසෝ
    ii)හම්සා අලාවී

35. i)නිරාගමිකවාදය
    ii)සමාජවාදය

36. i)අන්තර් රාජ්‍ය ගැටුම්
    ii)රාජ්‍ය අභ්‍යන්තර ගැටුම්
    iii)රාජ්‍ය නිර්මාණ ගැටුම්

37. i)ඒකීය ආණ්ඩු
    ii)සංධීය ආණ්ඩු
    iii)අර්ධ සංධීය ආණ්ඩු
    iv)සහසන්ධීය ආණ්ඩු

38. i)ජාතික රාජ්‍ය ජාතිකවාදය
    ii)ජනවාර්ගික ජාතිකවාදය

39. i)ගෝලීයකරණය මගින් ජාතික රාජ්‍යය අවසානයට පත්විය හැකි බව
    ii)ජාතික රාජ්‍යය අවසන් වන්නේ නැතිව එය යලි ව්‍යුහගත කිරීමකට ලක්වන බව

40. i)පෙරදිග ඉන්දියානු වෙළඳ සමාගම - මදුරාසි පාලනය
    ii)බ්‍රිතාන්‍ය රැජින - කිරීටය

41. i)ව්‍යවස්ථාදායක සභාව
    ii)විධායක සභාව

42. i)නිලලත් - 11
    ii)නිල නොලත් - 10

43. i)ස්ත්‍රී පුරුෂ සමාජභාවය
    ii)ස්ත්‍රී පුරුෂ ශ්‍රම විභජනය

iii)පීතෘ මූලිකත්වය

ivස්ත්‍රී පීඩනය

v)පුරුෂ කේන්ද්‍රීයත්වය

vi)පුරුෂ ආධිපත්‍යය

vii)ස්ත්‍රී විමුක්තිය

44. i)ස්වාධීනත්වය

ii)ඇසිස්ට්වාදය

45. i)රාජ්‍ය මන්ත්‍රණ සභාව

ii)61 යි

46. i)නියෝජිත මන්ත්‍රී මණ්ඩලය (මහජන මන්ත්‍රී මණ්ඩල, පළමු හා පහළ මන්ත්‍රී මණ්ඩලය)

ii)සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය (උත්තර මන්ත්‍රී මණ්ඩලය, උභය මන්ත්‍රී මණ්ඩලය, දෙවන මන්ත්‍රී මණ්ඩලය)

47. i)අග්‍රාණ්ඩුකාරවරයා

ii)ජනාධිපති

48. i)29 (2) වගන්තිය

ii)නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට සුළු ජාතීන් 06 ක් පත් කිරීම.

iii)සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයට සුළු ජාතීන් 15 ක් පත් කිරීම.

iv)බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ ක්‍රමය ඇති කිරීම.

v)ඡන්ද කොට්ඨාශ බෙදීම ස්වාධීන කොමිසමකට භාර දීම.

vi)කොමිෂන් සභා ඇති කිරීම. (රාජ්‍ය සේවය, අධිකරණ සේවය)

vii)කැබිනට් මණ්ඩලයට සුළු ජාතීන් පත් කිරීම.

49. i)ඒක මණ්ඩලිකවාදය

ii)ද්වි මණ්ඩලිකවාදය

50. i)අධිකරණ සේවා කොමිෂන් සභාව

ii)රාජ්‍ය සේවා කොමිෂන් සභාව

- එක් පිළිතුරකට ලකුණු 02 බැගින්

  අවසාන ලකුණු - $2 \times 20 = 40$

## II පිළිතුරු පත්‍රය

## <u>පරීක්ෂක උපදෙස් පත්‍රිකාව</u>

❖ දේශපාලන විද්‍යාව II වැනි ප්‍රශ්න පත්‍ර පිළිතුරු පරීක්ෂා කිරීමේ දී ප්‍රශ්නයට අදාල කරුණු කෙරෙහි අවධානය යොමු කොට අපේක්ෂකයින් තවත් කරුණු හා නිදසුන් වැනි දෑ ඉදිරිපත් කර තිබේ නම් ඒවායේ අදාළභාවය සැලකිල්ලට ගෙන ඒ සඳහා ලකුණු ලබා දීමට පරීක්ෂකවරයා ක්‍රියා කළ යුතුය.පිළිතුරු සඳහා ලකුණු ලබා දීමේ දී පහත දැක්වෙන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

1) ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගෙන තිබේද, හැඳින්වීම හා ප්‍රවේශය මගින් ඒ බව අවබෝධ කර ගැනීම.

2) ප්‍රශ්නයට අදාල කරුණු නිවැරදිව තෝරාගෙන තිබේද? ඒම කරුණු නිවැරදිව විධිමත් අයුරින් සංවිධානය කොට ඉදිරිපත් කර කිබේද?

3) කරුණු ප්‍රමාණවත් අයුරින් විශ්ලේෂණය කර තිබෙනවාද?

4) අවසාන නිගමනයකට ඒළඹ තිබෙනවාද? ඒම අවසාන නිගමනය තාර්කික හා හරවත් ඒකක්ද යන්න අවබෝධ කර ගැනීම.

5) අපේක්ෂකයින් ලියා ඇති පිළිතුරු වල අන්තර්ගතය කෙරෙහි වඩාත් අවධානය යොමු කර තිබෙනවාද යන්න අවබෝධ කර ගැනීම.



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න